චක්‍රලේඛ අංක : 13 /2016

මගේ අංකය : කේ05/5/විවිධ/32 /2016
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
2016-03-04 වන දින.

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරී වෙත .

## සිර සැකකරුවන් ආරක්ෂණය කිරීම.

බන්ධනාගාර ආයතන මගින් ආරක්ෂණ සිදු කිරීමේදී සිර සැකකරුවන් බොහෝ දුරට අත් අඩංගුවෙන් පැන යන බවට වාර්තා වී ඇත . මෙසේ කරුණු සොයා බැලීමේදී අණාවරනය වූයේ නිලධාරීන්ගේ නොසැලකිලිමත් බව හා ප්‍රමාණවත් නිළධාරීන් ආරක්ෂණයේ යෙදවීමක් සිදු නොවන බවය . එබැවින් මින් ඉදිරියේදී බන්ධනාගාර ආයතන භාර අධිකාරීවරුන් සහ සහකාර අධිකාරීවරුන් විසින් මේ සම්බන්ධයෙන් පවතින නීති රීතිවලට සහ ආරක්ෂණ යැවීම සම්බන්ධයෙන් නිකුත්කල චක්‍රලේඛනවල සඳහන් නියෝග වලට අමතරව පහත සඳහන් පරිදි ක්‍රියා කළ යුතු බව මින් දන්වමි.

01. බන්ධනාගාර අත්අඩංගුවට පත්වන සියළුම රැඳවියන්ගේ ආරක්ෂණ එම ආයතන මගින් බන්ධනාගාර බස්රථවලින්ම පමණක් ආරක්ෂණය කලයුතු අතර මොනයම් හේතුවක් මත හෝ පොදු මගී ප්‍රවාහන සේවය භාවිතා නොකල යුතුය.ප්‍රමාණවත් පරිදි බන්ධනාගාර ප්‍රවාහන පහසුකම් නොමැති අවස්ථාවලදී කුලී පදනම යටතේ ලංගම බස්රථ ලබා ගැනීමට කටයුතු කල යුතුය. ආරක්ෂණ පිටත්වන ආයතනයේ සිට ගමණාන්තය දක්වා ඇති දුර ප්‍රමාණය කිලෝමීටර් 100 ට වැඩි නම් එම ආරක්ෂණ පෙරවරු 6.00 ට පමණවත් ආයතනයෙන් පිටත්වීම සිදුකල යුතුය . ආරක්ෂණ යැවීමට පෙර ආරක්ෂණ පැමිණෙන බවට අදාල ආයතන අධිකාරීවරයාට දුරකථන පණිවුඩයක් මගින් හෝ ෆැක්ස් පණිවුඩයක් මගින් දැන්වීම සිදුකල යුතුය.

02. සියළුම ආරක්ෂණ සඳහා යොදවන සිර සැකකරුවන් හට අවශ්‍ය අහාර පාන බන්ධනාගාරය මගින් ලබාදීම සිදුකල යුතු අතර , අතර මග නවතා අහාර ලබාගැනීම් සිදුනොකල යුතුය , අත්‍යවශ්‍යතාවයක් ඇත්නම් පමණක් ආරක්ෂණය යන අතර මග ඇති බන්ධනාගාරයක, සිර මැදිරියක හෝ පොලිස් ස්ථානයක නවතා අදාල අහාර පාන ලබාදීම් සහ සනීපාරක්ෂක කටයුතු සිදුකල යුතුය. බොහෝ ආරක්ෂණ වල සිරකරුවන් ගමන් ගන්නා කොටසේ ආරක්ෂණ නිලධාරීන් යෙදවීමක් සිදු නොවන බවට සිරකරුවන් පැනයාම සම්බන්ධයෙන් කරන ලද මූලික විමර්ෂණවලින් අණාවරණය වී ඇත . එබැවින් මින් ඉදිරියේදී ආරක්ෂණ භාරව යන කාර්යභාර නිළධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට කටයුතු කිරීම සිදු කල යුතුය .

03. විශේෂ ආරක්ෂණයන් යෙදවීමේදී වෙනම බන්ධනාගාර බස්රථයක් යෙදවීමට හැකි සෑම විටම කටයුතු කල යුතුය. එසේම විශේෂ ආරක්ෂණ වලට නිළධාරීන් යෙදවීමෙදී ඒ සඳහා යෝග්‍ය තෝරාගත් නිළධාරීන් යෙදවීම කල යුතුය .

04. ආරක්ෂණය සඳහා යොදවා ඇති රථය රියදුරු විසින් ආරක්ෂණය රැගෙන යාමට සුදුසු තත්වයේ ඇති බවට ප්‍රධාන ජේලර් වරයා වෙත වාර්තා කලයුතුය .

05. ඔබ ආයතනවලින් කොළඹ හරහා වෙනත් බන්ධනාගාර ආයතන වෙත මාරු කිරීමට අවශ්‍යනම් නියමිත සිර සැකකරුවන් මාරු කිරීමට පෙර කොළඹ රිමාන්ඩ් බන්ධනාගාර අධිකාරී සමග

සාකච්ඡාකර ආක්ෂණ ඇත්නම් , එම ආරක්ෂණ බොහෝවිට ඉරිදා ආක්ෂණය රැගෙන යාමට පහසුවන පරිදි සෙනසුරාදා දිනයන්හි සිරකරුවන් වැලිකඩ බන්ධනාගාරයටත් සැකකරුවන් කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයටත් මාරු කල යුතුය . කොළඹ ආයතනවලින් පිටත්වන ආරක්ෂණයන් කොළඹ ආයතනවල අධිකාරිවරුන් සමග සාකච්ඡා කර එක් ආයතනයකින් පමණක් ආරක්ෂණයක් යෙදවිය යුතුය .

06. එවැනි ආරක්ෂණ නොමැති අවස්ථාවල හෝ කොළඹින් පිටත්වන ආරක්ෂණ වල ප්‍රමාණවත් ඉඩ කඩ නොමැති අවස්ථාවල හෝ විශේෂ ආරක්ෂණවල ආරක්ෂාව පිළිබඳ ගැටළු සහගත තත්වයක් මතුවන අවස්ථාවල අදාල අධිකාරිවරුන් දැනුවත් කර සෘජුවම ආරක්ෂණය කිරීම සිදුකල හැකිය පිටත ආයතනවලින් එන ආරක්ෂණවලට කොළඹින් ආරක්ෂණ රැගෙන යාමට ඇති අවස්ථාවලදී එම ආරක්ෂණ ලබා ගැනිමට ප්‍රමාදවන්නේනම් හෝ රාත්‍රි කාලයේ ආරක්ෂණය කිරීමට සිදුවන අවස්ථාවලදී එදින රාත්‍රිය කොළඹ නතරවී පසුදින ආරක්ෂණ රැගෙන පිටත්වීම සිදුකල යුතුය .

07. සියළුම ආයතනවලින් පිටත්වන ආරක්ෂණයන් ගමන් මාර්ගයේ හෝ ගමන් මාර්ගයට ආසන්නත ඇති බන්ධනාගාර ආයතනවල ඇති ආරක්ෂණයන් රැගෙන යාමට ප්‍රමාණවත් ඉඩ කඩ ඇති සෑම අවස්ථාවකදීම ආරක්ෂාවට තර්ජනයක් නොමැතිනම් එම ආයතනවල ආර්ක්ෂණයන් රැගෙන යාම සිදුකල යුතුය. ආරක්ෂණ ඉඩකඩ නොමැති අවස්ථාවල හෝ විශේෂ ආරක්ෂණවල ආරක්ෂාව පිළිබඳ ගැටළු සහගත තත්වයන් මතුවන අවස්ථාවල අදාල අධිකාරිවරුන් දැනුවත්කර එම ආයතනවලින් සෘජුවම ආරක්ෂණය සිදුකල හැකිය .

ඉහත කරුණු සම්බන්ධයෙන් ඔබගේ අවදානය යොමුකර කටයුතු කරනලෙසත් සිර සැකකරුවන් ආරක්ෂණය කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු චක්‍රලේඛන සහ නිත්‍ය නියෝග 422 සිට 427 කෙරෙහි අවදානය යොමුකරනලෙස දන්වා සිටින අතර , ආයතන භාර අධිකාරිවරුන්ගේ සහ සහකාර අධිකාරි වරුන්ගේ අවදානය මින් යොමුකරවන අතර සියළුම ආරක්ෂණ සම්බන්ධයෙන් මෙසේ කටයුතු කලයුතු බව මින් නියෝග කරමි .

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන් ... ාර කොමසාරිස් ජනරාල්
... ධනාගාර මූලස්ථානය
කොළඹ - 09,